# දේව විශ්වාසයට මඟ පෙන්වන සංඥාවන්

[ සිංහල – Sinhala – سنهالي ]

ලෝක ප්‍රකට විද්‍යාඥ හාරූන් යහ්යා විසින්

සවූදි අරාබියේ අරබ් නිව්ස් පුවත් පත්‍රයෙහි

2014 ජුනි මස 13 දින පළ වූ ලිපිය

සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

2014 - 1435

IslamHouse.com

# آيات توصل إلى الإيمان بالله

« باللغة السنهالية »


**للباحث هارون يحيا**

جريدة عرب نيوس (الأخبار العربية)


١٣يونيه٢٠١٤م

ترجمة: جاسم بن دعيان


2014 - 1435

IslamHouse.com

# දේව විශ්වාසයට මඟ පෙන්වන සංඥාවන්

ලෝක ප්‍රකට විද්‍යාඥ හාරූන් යහ්යා විසින්

සවූදි අරාබියේ අරබ් නිව්ස් පුවත් පත්‍රයෙහි

2014 ජූනි මස 13 දින පළ වූ ලිපිය

උගත් ඉස්ලාමීය විද්වතුන්, “දේව විශ්වාසයට මඟ පෙන්වන සංඥාවන්” නම් සංකල්පය ලෙස සඳහන් කරනුයේ, නිර්මාණයේ සියලු සත්‍ය තොරතුරු, මැවීම් පිළිබඳ දැනුම සහ සාක්ෂීන් පිළිබඳවයි. එම සාක්ෂීන් තුළින් අල්ලාහ්ගේ පැවැත්ම සහ ඒක දේව විශ්වාසය කෙරෙහි ද එම දෙවියන් වහන්සේගේ බලය, බුද්ධිය සහ නිපුණතාව කෙරෙහි ද මඟ පෙන්වන බවයි.

දේව විශ්වාසය කරා මඟ පෙන්වන සාක්ෂීන් වැදගත් වන්නේ ඒවා මගින් මිනිසුන් දේව විශ්වාසය කරා පැමිණිය හැකි නිසාය. ආගමක් දහමක් නොමැතිකමේ අනතුරු ගැන සඳහන් කරන විට අල්ලාහ් *“ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් දේව විශ්වාස නොමැති අය වෙති.”* යැයි පවසයි. දේව විශ්වාසය නොමැති කෙනෙක් බොහෝ දේ ගැන

අනවබෝධයෙන් පසු වන අතර, තම වටා පිරී පවතින මැවීම් හී තිබෙන සාක්ෂින් කිසිවක් නොදකී. තමා ජීවත් වන සමාජයේ පිරී පවතින අදේව වාද ස්වභාවය නිසා ද, ඔහුගේ සිත දෛනික කරුණු වෙත පමණක් යොමු වීම නිසා ද ඔහුගේ අවබෝධය සහ බුද්ධිය දුබල වීමෙන් තම වටා තිබෙන මැවීම් හි සලකුණු කිසිවක් ඔහු නොදකී. එහෙත් මෙම පුද්ගලයා අවබෝධයෙන් සිටී නම්, දේව විශ්වාසය කරා ගෙන යන සලකුණු පිළිබඳ ව පහදා දෙනු ලැබුවේ නම්, දෙවි කෙනෙක් සිටින බව ද, ජීවි සහ අජීවි යන සියලු දේ දෙවියන්ගේ නිර්මාණය බව දැන ගන්නට ද දෙවියන් වහන්සේ ගේ බලය සහ ඔහුගේ සර්වඥතා ඥානය ගැන පහදා ගන්නට ද හැකි වනු ඇත. මේ නිසා, අනාගමික ඉගැන්වීම නිසා සත්‍යය කුමක් දැයි නොදන්නා නමුත් සමාජයේ යහපත් ලෙස ජීවත් වන ඇතැම් පුද්ගලයින් පවා අල්ලාහ්ගේ අභිමතයෙන් දේව විශ්වාසය කරා මඟ පාදනු ලැබිය හැකි වෙයි.

මෙලෙස අල්ලාහ්ගේ නිර්මාණය පිළිබඳ ව මෙනෙහි කිරීම දේව විශ්වාසය නොමැති අයට පමණක් නොව විශ්වාසීන්ට ද අවශ්‍ය ක්‍රියාවකි. විශ්වයේ තමා නිර්මාණය කළ සංඥාවන් පිළිබඳ ව

දීර්ඝ ව හා ගැඹුරු ව මෙනෙහි කරන ලෙස අල් කුර්ආන් හි අල්ලාහ් මිනිසාට ඇරයුම් කරයි.

විශ්වාසීන් නැමදුම් කිරීම, උපවාසයේ යෙදීම හා අනිකුත් ආගමික වතාවත් හි නිරත වීම වැනි ක්‍රියාවන්ට පමණක් සීමා නොවී ගැඹුරු ව කල්පනා කළ යුතුය. අහස් හි සහ පොළොවෙ හි නිර්මාණයේ සාධක පිළිබඳ ව ගැඹුරු ව කල්පනා කිරීමෙන් වර්ධනය වන ඔහුගේ දැනුම මගින් විශ්වාසීන්ගේ භක්තිය තවත් අධික වන බව අල් කුර්ආන් පවසයි. *"තිරසාර ව විශ්වාස කරන්නන්ට මිහිතල යෙහි සංඥාවන් ඇත. තව ද නුඹලා තුළ ද (සංඥාවන් ඇත) නුඹලා නිරීක්ෂණය නොකරන්නෙහු ද?"* සූරා අද් දාරියාත් 51:20, 21.

කෙනෙකු තුළ සහ ඔහුගේ ශරීරයේ සහ මිහිතලය මත තිබෙන සංඥාවන් එක්තරා දැනුම පදනම් කර ගත් විශ්වාසය වෙත ට ඔහු ට මඟ පෙන්වන බව මෙම වාක්‍යයන් පැහැදිලි ව පවසයි. මෙමගින් අල්ලාහ් කෙරෙහි බිය බැතිමත්කම තවත් අධික වන අතර, අල්ලාහ් අණ කළ දේ සහ තහනම් කළ දේ නිසියාකාර ව අනුගමනය කරනු පිණිස, ඒවා පිළිබඳ ව සියුම් ලෙස දැනුම සොයන්න ට කෙනෙක් වෑයම්

කරයි. අල්ලාහ්ගේ මැවීම් හි දක්නට තිබෙන සංඥාවන් ගැන මෙනෙහි කරන කෙනෙක් ඔහුගේ ක්‍රියාවලිය අල්ලාහ් බලා සිටින බව ද ඒවා සඳහා අල්ලාහ්ගේ තිලිණය ලැබෙන බව ද ස්ථිර ව දැන ගනියි. ඒ අයුරින් ම, කෙනෙකුගෙන් සිදු වන ඉතා සුළු ප්‍රමාණ වරදක් පවා අල්ලාහ් දකින බව දැනගත් විට ඔහු ඒ සඳහා පසුතැවිලි වීමට සහ ඒවායෙන් ඉවත් වීමට හැකි පමණ ඉක්මණින් ක්‍රියා කරනු ඇත.

*"විශ්වාසවන්තයනි! අල්ලාහ් ට බිය වවු. ඔහු වෙත ළං වීමට ද මාර්ගය සොයවු. ඔබ ජයග්‍රාහකයන් වනු පිණිස ඔහුගේ මාර්ගයෙ හි වීර්‍ය කරවු."* යනුවෙන් අල් කුර්ආන් 5:35 පවසයි.

මෙම වාක්‍යය පවසන අයුරින්, අල්ලාහ් ට සමීප වීම ට කෙනෙක් කරන වෑයම මගින් අල්ලාහ්ගේ සමාව සහ මෝක්ෂය ලබා ගැනීමේ බලාපොරොත්තු තැබිය හැක. දේව විශ්වාසය වෙත මඟ පෙන්වන සංඥාවන් තුළින් අල්ලාහ්ගේ පැවැත්ම සහ ඔහුගේ අලංකාරවත් නාමයන් ගැන ගැඹුරු ව අවබෝධ කර ගැනීමෙන් අල්ලාහ් ට සමීප වීමට හැකි වනු ඇත. නිදසුනක් වශයෙන්

අල්ලාහ්ගේ නිර්මාණය වන විවිධ ජීව රූප පරික්ෂා කිරීම, ඒවායේ අංග සම්පූර්ණ සැලැස්ම සහ ක්‍රම වේද ගැන මෙනෙහි කිරීමෙන් අල්ලාහ්ගේ බලය සහ සියලු දේ ගැන සර්වඥතා ඥානය පිළිබඳ යථාර්ථය ඉතා සමීප ස්ථානයේ සිට දැක ගත හැකි වේ.

*"අහසින් ජලය පහළ කළේ ද ඔහුය. එයින් නුඹලාට පානය ද, තවද එයින් නුඹලා(සහ නුඹලාගේ සතුන්)ට එහි ආහාර සපයන ගහ කොළ ද ඇත."* සූරා 16:10. අල්ලාහ්ගේ සංඥාවන් පිළිබඳව ද මෙනෙහි කිරීමෙන්, ඒවා තුළින් අල්ලාහ්ගේ හැකියාව ප්‍රකාශ වන ආකාරය දැක ගැනීමෙන් අල්ලාහ් ගැන තවත් පැහැදිලි ව අවබෝධ කර ගත හැකි වනු ඇත. මෙවැනි ගුණදම් සහිත කෙනෙක් අල්ලාහ් ගැන ක්‍රම ක්‍රමයෙන් අවබෝධ කර ගන්නා විට, ඔහු අල්ලාහ්ගේ බල මහිමය ගැන ද අවබෝධය ලැබ ඒවා තව තවත් අගය කිරීමට පටන් ගනී.

නිදසුනක් වශයෙන්, දේව විශ්වාසයට මඟ පෙන්වන සලකුණු ගැන ගැඹුරු ව මෙනෙහි කිරීමෙන් කෝටි ප්‍රකෝටි ජනතාවන් ගැන අල්ලාහ් දන්නා බව ද, සෑම අවස්ථාවන්හී ම ඔවුන් ව අල්ලාහ් පාලනය

කරන බව ද අවබෝධ කර ගනී. මිනිස් ශරීරයේ තිබෙන ට්‍රිලියන් ප්‍රමාණයක් සෛල, බිලියන් ප්‍රමාණයක් මිනිස් ශරීර මෙම පොළොවෙ හි ඕනෑම අවස්ථාවක අල්ලාහ්ගේ කැමැත්ත ට එකඟ ව පවතිනු දැක ගත හැක. මේවා සියල්ල සිදු කිරීම සහ ප්‍රවර්තනය කිරීම සඳහා, අසීමිත බලය, දැනුම, බුද්ධිය සහ ඥානය අවශ්‍ය වේ. මෙම යථාර්ථය පමණක් ගැන මෙනෙහි කරන කෙනෙක්, අල්ලාහ්ගේ අසීමිත ගුණාංගයන් සහ හැකියාවන් පිළිබඳ ව සාක්ෂි දරන අතර, අල්ලාහ්ගේ සර්ව බලධාරිත්වය අගය කරනු ඇත.

ඉතාමත් කුඩා මැස්සෙකු ව නිදසුනක් ලෙස සඳහන් කරන අල්ලාහ්, ඒ ගැන මෙනෙහි කරන ලෙස ද ආරාධනා කර, මෙවැනි සත්‍යය ගැන අනවධානයෙන් සිටින ජනයා, අල්ලාහ්ගේ අසීමිත බලය පිළිබඳ ව වටහා ගන්නට අපොහොසත් වූ පිරිසක් බව කුර්ආනයේ මෙසේ හෙළි දරව් කරයි.

*“අහෝ මිනිසුනි! උපමාවක් ගෙන හැර පෙන්වන ලදී. එබැවින් නුඹලා එය සවන් දෙවූ. සැබැවින් ම අල්ලාහ් හැර නුඹලා අයැදින්නන්, ඔවුන් (සියල්ලෝම) එක්රැස් වුව ද මැස්සෙකු පවා මැවිය*

*නොහැක්කෝමය. තවද, මැස්සා ඔවුන්ගෙන් යමක් පැහැර ගත්තේ නම් ඔවුන් එය උගෙන් නැවත ලබා නොගන්නෝය. (මෙලෙස) අයැදින්නා ද අයැදිනු ලබන්නාද බලහීන විය.*

*ඔවුහු අල්ලාහ් ට ඇගැයිය යුතු අයුරින් ඔහු ව ඇගයීමට ලක් නොකළෝය. සැබැවින් ම අල්ලාහ් අති ශක්තිවන්තය; අති බලසම්පන්නය.”* සූරා 22: 73 සහ 74.

දේව විශ්වාසය වෙත ට මඟ පෙන්වන සංඥාවන් ගැන මෙනෙහි නොකරන්නන් අල්ලාහ් කෙරෙහි බිය නොවන්නන් බවට සඳහන් කරන තවත් කුර්ආන් වැකි කිහිපයක් පහළ වී ඇත. *“අහසින් (වැස්සෙන්) ද, පොළොවෙන් ද (උද්භිදයෙන්) ඔබට ආහාර සම්පාදනය කරන්නේ කවරෙක් ද? ශ්‍රවණය ද, දර්ශනය ද හිමි කවරෙක් ද? මළවුන්ගෙන් ජීවය සිදුකරන්නේත්, ජීවයෙන් මරණය සිදුකරන්නේත් කවරෙක් ද? සියලු දෑය පරිපාලනය කරන්නේ කවරෙක් දැ? යි කියව. අල්ලාහු යැයි ඔවුහු කියන්නෝය. එසේ නම් ඔබ ඔහුට නොබිය වන්නහුදැ? යි කියව. ඔහුය ඔබගේ සත්‍ය පරමාධිපති වූ අල්ලාහ් ය. එහෙයින් සත්‍යයට පසුව, නොමඟ*

*මිස කුමක් ද? ඔබ කෙසේ හරවනු ලබන්නේ ද?"*
සූරා 10:31,32

විශ්වාසය වර්ධනය කිරීම සහ අල්ලාහ් ට සමිප වීම සඳහා සහය වන සංඥාවන් පිළිබඳ ව නොකඩවා මෙනෙහි කිරීමේ වැදගත්කම ගැන අල් කුර්ආනයේ විවිධ ස්ථානයන් හි සදහන් වී ඇත. නිදසුනක් වශයෙන් මූඃමින්වරු මහ පොළොව සහ අහස නිර්මාණය කිරීම පිළිබඳ ව දීර්ඝ ව සහ ගැඹුරු ව කල්පනා කරන බව අල් කුර්ආන් පවසයි.

*"සැබැවින් ම, අහස් සහ පොළොව නිර්මාණයෙහි ද රෑ දවාල මාරුවීමෙහි ද නුවණැතියන් ට සංඥාවන් ඇත. ඔවුන් නැගිට සිටිමෙන් ද, හිඳගනිමින් ද, ඇළෙ වී සිට ද, ඔවුහු අල්ලාහ් සිහි කරන්නෝය. අහස් සහ පොළොව නිර්මාණයෙ හි ඔවුහු මෙනෙහි කරන්නෝය. අපගේ ස්වාමිනි, ඔබ සුවිශුද්ධය. එසේ හෙයින් ගින්නෙහි වේදනාවෙන් අප ආරක්ෂා කරව."*
සූරා 3:190,191.

දේව විශ්වාසයට මඟ පාදන සංඥාවන් පිළිබඳ ව ගැඹුරු ව පරීක්ෂණ කිරීම සහ ඒවා ගැන දීර්ඝ ව කල්පනා කිරීම තුළින් ජීවීන් සහ අජීවීන් යන සියල්ල අල්ලාහ්ගේ සම්පූර්ණ පාලනය සහ

ආධිපත්‍යය යටතේ පවතින යථාර්ථය නිසැක ව පහදා ගත හැකි බව ඉහත සඳහන් කුර්ආන් වාක්‍යයන් පෙන්වයි. මෙම අවබෝධය මගින් අල්ලාහ් ට සම්පූර්ණ අවනත වීම සිදු කෙරේ.

මිනිසාගේ ශරීරය තුළ සිදු වන සංකීර්ණ ක්‍රම වේදය සහ ඒවායේ සියුම් සමතුලණය පිළිබඳ ව දන්නා විශ්වාසියෙක්, කිසිදු දෝෂයෙන් තොර ව සිරුර තුළ ක්‍රියා කරන ක්‍රමවේදයේ නිර්මාතෘවරයා තමා නොවන බව සහ මේවා නිර්මාණය කළේ තමාට බාහිර ව පවතින ශක්තියක් බව අවබෝධ කර ගනී. තම ශරීරය ලෙස හැඳින් වන ස්කන්ධය, සෛල හා පරමාණු යන සියල්ලන් හි සංචිතයක් බව ද, ඒවාට සිහි බුද්ධියක් හෝ සංවේදක ඉන්ද්‍රයන් හෝ ස්වාධීන ව කල්පනා කිරීමේ හැකියාවක් හෝ නොමැති බව මිනිසා අවබෝධ කර ගනී. මේ බව අවබෝධ කර ගත් මිනිසෙක්, තම සිරුරේ තිබෙන සෑම සෛලයක් ම, සෑම පරමාණුවක් ම මැවුම් කරුගේ කැමැත්ත ට සහ නියෝගය ට එකඟ ව ක්‍රියා කරන බව නිසැක ව නිගමනය කරයි. මෙවැනි භූමිකාවෙ හි අහම්බෙන් හෝ වැරදීමකින් හෝ අත්හදා බැලීමකින් හෝ කිසිවක් සිදු වීමට කිසිදු

ඉඩකඩක් හෝ අවස්ථාවක් නොමැති බව ඔහු අවබෝධ කර ගනියි.

ඔබේ අදහස් පහත සඳහන් ලිපිනයට එවන්න.
sinhala@islamhouse.com